# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2006 අංක 1 දරන ආණ්ඩුවේ ආදායම ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 ජනවාරි මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 ජනවාරි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.25 යි.        තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2006 අංක 1 දරන ආණ්ඩුවේ ආදායම ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන)

[සහතිකය සටහන් කළේ 2006 ජනවාරි මස 06 වන දින]

එල්. ඩී. – ඕ. 63/2005

## රජයේ ආදායම ආරක්ෂා කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි

රජයේ ආදායම ආරක්ෂා කිරීම සහ ආණ්ඩුවට ලැබෙන ආදායම නැතිවීම වැළැක්වීම ජාතික ආර්ථිකයේ යහපත උදෙසා අවශ්‍ය වන හෙයින් ද: පූර්විකාව.

ඉහත කී කරුණු බලාත්මක කිරීම සඳහා, ඇතැම් නිශ්චිත නීති යටතේ රජයේ ආදායම එකතු කිරීම ඵලදායී ලෙස පහසු කිරීම සඳහා නෛතික විධිවිධාන සැලැස්වීමට අවශ්‍යව ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

**1**. මේ පනත 2006 අංක 1 දරන ආණ්ඩුවේ ආදායම ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මෙහි උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දැක්වෙන යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එවැනි යම් නීතියක් යටතේ උචිත අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියමයක්, අමාත්‍යවරයා විසින් එම නියමයේ තම අත්සන තබනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය. ඇතැම් නීති යටතේ සාදන ලද නියමයන් අමාත්‍යවරයා විසින් අත්සන් කළ දිනයේ දී බලාත්මක විය යුතු බව.

**3**. මෙහි උපලේඛනයේ II වන කොටසෙහි නිශ්චිතව දැක්වෙන යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුන ද, ශ්‍රී ලංකාවට හෝ ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ ආනයනය කිරීම හෝ අපනයනය කිරීම මත යම් බද්දක්, තීරු බදු, අධිභාර, අයකිරීම් හෝ වෙනත් ගාස්තුවක් පැනවීමේ හෝ අයකිරීමේ කාර්ය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ආනයනය කිරීමේ හෝ අපනයනය කිරීමේ දිනය විය යුත්තේ එම බද්ද, තීරු බද්ද, අධිභාරය, අයකිරීම හෝ වෙනත් ගාස්තුව පනවනු ලැබූ හෝ අයකරනු ලැබූ භාණ්ඩයට අදාළව ඇතුළුවීමේ බිල්පත්‍රය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබූ දිනය විය යුත්තේ ය. අපනයනය කිරීමේ හෝ ආනයනය කිරීමේ දිනය ඇතුළුවීමේ බිල්පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනය විය යුතු බව.

**4**. මේ පනතේ විධිවිධාන 2004 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එවැනි යම් නීතියක් යටතේ 2004 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියමයක් අමාත්‍යවරයා විසින් එම නියමයේ තම අත්සන තබනු ලැබූ දිනයේ සිට බලාත්මක වනු ලැබූ ලෙස සහ ක්‍රියාත්මක වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. මේ පනත බලාත්මක වීමේ දිනය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය

I වන කොටස

1. 1996 අංක 7 දරන පනත මගින් අවසන්වරට සංශෝධිත (52 වන අධිකාරය වූ) සුරා බදු ආඥාපනත.

2. 1994 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත.

II වන කොටස

1. 1996 අංක 7 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (52 වන අධිකාරය වූ) සුරා බදු ආඥාපනත.

2. 1994 අංක 8 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත.

3. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත.

4. 2003 අංක 2 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.